

# වික්ටර්... ඔබ හා මම

## VICTOR RATNAYAKE - IN CONCERT

''ස'' - උත්තර භාරතීය රාගධාරී සංගීත හෝඩියේ මුලකුරයි ''ස''.
වික්ටර් - හෙළ ගී පුරාවතේ පවුරූ සීමා සිඳලමින් සියළු ඉසව් යා කළ ගාන්ධර්වයායි වික්ටර් රත්නායකයන්. එසේ නම් ''ඔබ හා මම''? කවුරුන් ද ඔබ හා මා?

අප අපව ම හඳුනාගැනීමටනම් දෙවැනි වතාවටත් ''ස'' සහ ''වික්ටර්'' හඳුනාගත යුතු වන්නේය.

''ස'' යනු ස්වර සප්තකයේ මුල් ම ස්වරය පමණක් ම ද අප හට ? නැත්තේ ම යි ! එකිනෙක පරයන නිර්මාණයන් කිරීමෙහි ලා නො තිත් ආශාවන්ගෙන් උන්මාදිත කලා නිමැවුම්කරුවන්ගේ දශකය වූ සැත්තෑව දශකය යළිත් සිහිපත් කරගත හැකිනම් ? සැත්තෑව දශකයේ රසිකයිනටනම් ''ස'' ස්වරයක් හෝ හෙළ බසෙහි අක්ෂරයක් පමණක් ම නොවේ. හෙළ ඒකාංගික මියැසි ප්‍රසාංගිකත්වයේ නැගුණු රන් කෙහිළි සැරසූ ස්වරයයි ''ස''. මියැසි ප්‍රසංගයන් අතර ජනප්‍රියත්වයේ හිණි පෙත්තෙහි නැංවූ ජය ධජ පතාක අරා හුන් අක්ෂරයයි ''ස''. ප්‍රසංග වාර දහස් ගණන් ඉක්මවමින් සැත්තෑවේ දශකයේ සිට දශක පුරා නොනැවතී ගලා යන මහා ගී රසෝඝයේ රළ පතරේ දිදුළන ලාංඡනයයි ''ස''. හෙළ ගී අඹරෙහි පෑ මහා ස්වර පෙළහරයි ''ස''.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඖෂධ සංයෝජකයෙකු වූ කඩුගන්නාවේ රත්නායක ආරච්චිලාගේ දොන් ජේම්ස් මහත්මාටත් අබේකෝන් මායාදුන්නලාගේ සුමනාවතී මැතිණියටත් දාව වර්ෂ එක්වා දහස් නවසිය හතළිස් දෙකක් වූ නවම් මස දහ අට වන ද උපන් වාසනාවන්ත කුමරුවා යි රත්නායක ආරච්චිලාගේ දොන් වික්ටර්. අන් අයෙකුගේ ෆුට් බැලෝ සර්පිනාවක් ලද ඉසිඹුවකදී වාදනය කරන්නට තැත් දරද්දී හිමිකරුගෙන් ''ටොක්කක්'' කෑ දඟයායි වික්ටර්. අනුන්ගෙන් දඬුවම් නො විඳින්නට පියාණන් ගෙනැවිත් දුන් ෆුට් බැලෝ සර්පිනාව වයමින් හා ගයමින් සිය සොයුරන් සමඟින් කඩුගන්නාව ප්‍රදේශය මියැසියෙන් සෙළැවූ දරුවායි වික්ටර්. සිය පියාණන්ගේ හිතවතෙකු වූ ඩී. ඒ. ඩී. ධර්මදාසයන් අතින් සර්පිනාවට අත හුරු කර ගනිමින් ද, මහනුවර එම්. පී. පී. කලායතනයේ අධිපති සිරිල් පෙරේරා සංගීතාචාර්යවරයාණන් යටතේ වයලීනය ක්‍රමවත්ව හදාරමින් ද, ආර්.ඒ. චන්ද්‍රසේන සංගීතවේදියාණන්ගෙන් සිය ශිල්පීය මඟ ස්ථිරසාර මඟකට යොමු කර ගනිමින් ද, අවසනැ එකල හේවුඩ් ආයතනය නමින් හැඳින් වුණ රජයේ සංගීත විද්‍යාලයට ඇතුලත්ව වාදනය මෙන්ම ගායනය ද හදාල ගැටවරයායි වික්ටර්.

ශාස්ත්‍රීය ඥානය මෙන්ම, ප්‍රායෝගික ශිල්පීය හැකියාවන් වර්ධනය කර ගැනීමටත් එක සේ වාසනාව ලද, ඒ වෙනුවෙන් ම කැපවී අභ්‍යාසයෙහි යෙදුණු, ඒ නිසාවෙන් ම නො බිඳියහැකි ස්ථිර පදනමකින් යුක්තව ගායන ක්ෂේත්‍රයට එළැඹි සංගීතවේදියෙකි වික්ටර් රත්නායකයන්. රත්නායකයන්ගේ තාරුණ්‍යයේ මෝහණීය කට හඬ ඇසූ ඇසූවන් වෙන් නොවන සේ බඳනා වර පටක් සේ වීය. වරෙක ප්‍රේමාන්විත වූත්, වරෙක ජාත්‍යාලයෙන් ඔද වැඩුනා වූත්, වරෙක බැති බර වූත්, තවත් වරෙක හැඟීම් බර වූත්, තවත් වරෙක උපහාසාත්මක වූත්, තවත් වරෙක උපදේශාත්මක වූත්, රත්නායකයන්ගේ කට හඬ විටෙක සෞම්‍ය ව ගායනාවන්නේ ය. විටෙක වේගවත්ව පද අමුණන්නේ ය. තවත් විටෙක සුසුම් පාලනය කරගනිමින් දීර්ඝව ගැයෙන්නේ ය. තවත් විටෙක නිරන්තරයෙන් ඉහළ පහළ දිවෙන ස්වරස්ථාන ස්පර්ශ කරමින් ගේය කැටයම් නිම වන්නේ ය. තවත් විටෙක මේ සියල්ල මුහුකරමින් නැවුම් බවකින් යුත් අපූර්වත්වයක් ගායනයට කැටි කරවන්නේය. නිවැරදි ගායන හුරුවකට කදිම වූ නිදර්ශනයයි රත්නායකයන්ගේ ගායනය. හෙළ ගායනයේ ''ගමනක්'' යන්නෙකුට හොඳම පූර්වාරදර්ශනය යි රත්නායකයන්ගේ ගායනය.

සිය කට හඬෙහි වූ අනන්‍යතාවය වික්ටර් රත්නායකයන් සහජයෙන් ම ලද වාසනා ගුණයයි. අන් සියළු ගායක ගායිකාවන් හා පෑහී ගිය හඬකි ඒ. රුක්මණී දේවියගේ සිට විශාරද නන්දා මාලනී, ලතා වල්පොල, සුජාතා අත්තනායක, නෙරන්ජලා සරෝජිනී, නීලා වික්‍රමසිංහ, නෙලූ අධිකාරී, ඉන්ද්‍රානි පෙරේරා, චන්ද්‍රිකා සිරිවර්ධන වැනි විවිධ ශිල්පිනියන්ගේ හඬ හා මුසු වූ රත්නායකයන්ගේ ප්‍රේමනීය යුග ගී දියවර උරේෂා රවිහාරිය වැනි නව යුගයේ යොවුන් ගායිකාවන් සමඟින් අද ද ගලා බසින්නේ ය. පණ්ඩිත් අමරදේවයන්ගේ පටන් සිසිර සේනාරත්න, අයිවෝ ඩෙනිස්, මහාචාර්ය සනත් නන්දසිරි, සුනිල් එදිරිසිංහ, එඩ්වඩ් ජයකොඩි, මිල්ටන් මල්ලවාරච්චි, එච්. ආර්. ජෝතිපාල, එම්. එස්. ප්‍රනාන්දු ආදී විවිධ ඉසව් වෙත යොමු වූ ගායන ශිල්පීන් සමඟින් යාවී ය රත්නායකයන්ගේ ගායනීය හඬ.

පසුගිය ද කැළණිය සෞන්දර් ය විශ්ව විද්‍යාලයීය ආචාර්ය පදවියකින් පිදුම් ලබන්නට හේතු කාරණාව වූයේ වික්ටර් රත්නායකයන්ගේ ගායන ශිල්පය පමණක්ම නොවේ. පසු ගිය දශක ගණනාව පුරා කළ නැවුම් විචිත්‍රවත්, විවිධාකාර වූ තනු හා සංගීත නිර්මාණකරණයයි. පණ්ඩිත් අමර දේවයන්ගේ පටන් හර්ෂන දිසානායක යෞවන ගායන ශිල්පියා දක්වාත් විශාරද නන්දා මාලනිය, රුක්මණී දේවිය ගේ පටන් උරේෂා රවිහාරී යෞවන ශිල්පිනිය දක්වාත් එකිනෙකාට වෙනස් වූ ශිල්පී ශිල්පිනියන් වෙත කළා වූ එකිනෙකට වෙනස් තනු හා සංගීත නිර්මාණ ප්‍රමාණය ගිණිය නොහැකි තරම් ය. අබේවර්ධන බාලසූරිය ශිල්පියාට පමණක් කළ තනු ගණනින් සැත්තෑව ඉක්මවයි. සුනිල් එදිරිසිංහයන් දොරට වැඩියේ ''සඳකඬ පහණක'' ගීතය සඳහා නිර්මිත තනුව හා සංගීත රටා නිසා නොවේ ද ? ෆ්‍රෙඩී සිල්වා ශිල්පියාණන්ගේ උපහාස ගීත බොහොමයක් මෙන්ම කර්ණාටක සංගීත වේදයට අනුව නිර්මිත ''කුණ්ඩුමණී'' ගීතයේ තනු හා සංගීත රචකයා යි වික්ටර් රත්නායකයන්.

''සිරිබෝ අයියා'' වැනි වෙනත් චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂණය සඳහා සම්මානයෙන් පුද ලැබූහ රත්නායකයෝ. සම්මානයට පාත්‍ර නො වූවද රත්නායකයන් විසින් හෙළ රිදී සිනමාවේ රන් සළකුණක් තැබූ සංගීත අධ්‍යක්ෂණයෙන් යුත් වූ චිත්‍රපටයකි ''සරුංගලේ''. සංගීත අධ්‍යක්ෂණය කල ටෙලි නාට්‍ය පිළිබඳව ද අමතක කළ නොහේ.

ඉතින් නම් වික්ටර් රත්නායකයන්ට පෙම් බැඳි ''ඔබ හා මම'' හඳුනා ගැනීම අපහසු නොවනු ඇත. රත්නායක හඬින් මෝහනය වූ, රත්නායක ස්වර පෙළහරින් සංවේදී වූ, රත්නායක ගී සමුද්‍රයෙන් ආනන්දමත්ව ඥානය වූ, සැත්තෑව දශකයෙන් උපන් රසිකයෝ නො වන්නෙමු ද ''ඔබ හා මම'' ? සැබැවින් ම එය සාඩම්බරයක්ම නොවන්නේ ද ''ඔබට හා මට'' ?

විවිධා කාර වූ රස තල සිසාරා සැරූ රසික කැලකි ''ඔබ හා මම''. නැවුම් වූත් හරවත් වූත් වින්දනීය ගුණය දශක ගණනාවක් තිස්සේ වැඩ වූ රසවතුන් පෙළකි ''ඔබ හා මම''. ''කොට කලිසම්'' ඇඳි පාසල් සිසුන් ලෙසින් මෙන්ම තරුණ දූ පුතුන් සිටිනා දෙමව්පියන් ලෙසින් ද එක ම රස ගුලාවක රසාලිප්තවන්නෝ වෙමු ය ''ඔබ හා මම''. නො රටකදී වුව ද එය විඳින්නට අදට ද වාසනාවන්තයෝ වෙමු ය ''ඔබ හා මම''.

''ස'' වික්ටර් හා මෙවර ''ඔබ හා මම'' මුසුවන්නේ මෙපුර මහා කලා කේන්ද්‍රය වූ ආර්ට් සෙන්ටර් (ART CENTRE) හි දීය. 2011 ජනවාරි 30 දා සවස 6.00 ට එහි රුස්වන දෙදහසක් ඉක්මවූ රසවතුන් සමඟින් වික්ටර් රත්නායකයන්ගේ හඬ සමඟ අත්පොළසන් හඬ මුහු කරනා ප්‍රබුද්ධ රසිකයන් වන්නෙමු ය ''ඔබ හා මම''. හෙළයේ ප්‍රමුඛතම වාද්‍ය වෘන්දයක මියැසියට දැහැන් ගත වන ශ්‍රාවකයින් වන්නේමු ය ''ඔබ හා මම''. රත්නායකයන්ගේ ගී දසුන් හි සමාධි ගත වන ප්‍රේක්ෂකයෝ වන්නෙමුය ''ඔබ හා මම''. ඉතින් මුණ ගැසෙමු ''ස'', වික්ටර්, ඔබ හා මම ඒ සුවිසල් රසිකාගාරයේ දී සැත්තෑවේ දශකය යළිදු එහි මවන්නට.

සිසිර දිසානායක



Digital Art - Sumith & Devika Perera 59954478